# බලන්ගොඩ නගර සභාව

## 2018-10-11 දිනැති මහා සභා වාර්තාව

**ස්ථානය - බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2018.10.11**

**වේලාව - පෙ.ව. 8.00**

**බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවල මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 17. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිලධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |

## 01. පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීම

**පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීමේ යෝජනාව ගරු** සභාපතිතුමන් විසින් සභාවට දැනුම්දුන් අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා විසින් 2018.09.13 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්තිත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් එය ස්ථිර කරන ලදුව පසුගිය සභාවේ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් සභා වාර්තාව අසත්‍ය වාර්තාවක් බවට පවසා සිටි අතර සභා වාර්තාව සමාලෝචනය කිරීමට උත්සාහ කරන ලදි. එම අවස්ථාවේදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාට අවස්ථාව ලබාදෙන තෙක් නිහඬ වන ලෙස ගරු සභාපතිතුමන් විසින් කිහිප විටක් නියෝග කළද එය ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් මැතිතුමන් විසින් නොපිළිගැනීම හේතුකොට ගෙන ගරු සභාව උණුසුම් තත්ත්වයකට පත්වූ අතර එය ගුටිබැට හුවමාරුවක් දක්වා පත්වූ බැවින් ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව විනාඩි 10 ට කල් තබන ලදි.

නැවත පෙ.ව.10.20 ට සභාව ආරම්භ කල අවස්ථවේ ගරු සභාපතිතුමන් විසින් සභාව අමතමින් අද දින සභාව තුළ සිදුවූ කළහකාරි සිදුවීම හේතුවෙන් මාගෙන් හා නිළධාරින්ගෙන් එම අවස්ථාවේම කට උත්තර ලබා ගැනීමට පොලිස් නිළධාරින් විසින් ක්‍රියාකිරීම හේතුවෙන් සභාව නියමිත පරිදි ආරම්භ කිරීමට නොහැකි වූ බව ප්‍රකාශ කර සිටින ලදී. එම අවස්ථාව වන විට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සභා ගර්භයෙන් ඉවත්ව ගොස් සිටි අතර එදින සභාවට නොපැමිණෙන ලදී.
මෙහිදී පසුගිය වාර්තාවේ සංශෝධනයන් ලෙස, ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් 2018/9/13 දින පැවති සභා වාරයේ **04:02:02**මැණික් කඩ,මහජන පොළ කඩ,ගබඩා කාමර,විවෘත භූමි සඳහා වන තක්සේරුව ක්‍රියාත්මක කිරීම **යන යෝජනාව යටතේ** පිටුපස කඩ කාමර ගබඩා කඩ කාමර වන බැවින් එහි තක්සේරු මුදල අඩුවිය යුතු යන්න සඳහන් විය යුතු බව පවසා සිටින ලදී.

## 02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

01. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන ආරම්භ කරමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් පොදු වෙළඳසැල භාරකරු යූ. ශාන්ත අබේසේකර යන අයට මරණීය තර්ජන කළ බවට පවසා ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදි.
02. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් කාර්යාලයට යාබදව ඉදිකරමින් පවතින ගොඩනැගිල්ලට එරෙහිව ඉදිරිපත් කර තිබූ පෙත්සමකට පිළිතුරු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදි.

**03. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා/ටෙන්ඩර් ඉදිරිපත් කිරීම**

**<u>ටෙන්ඩර් පත් විවෘත කිරීම</u>**

ඉන් අනතුරුව එදිනට යෙදීතිබූ ටෙන්ඩර් විවෘත කිරීමේ අවස්ථාව එළඹී බැවින් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් ගරු උපසභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලදි. ඒ අනුව ටෙන්ඩර් මණ්ඩලයේ කටයුතු ආරම්භ කරන ලදි.

ටෙන්ඩර් මණ්ඩලයේ කටයුතු අවසන් වූ බැවින් කාරක සභාව ගරු සභාපතිතුමාගේ නැවතත් යෝජනාවෙන් ගරු උපසභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභා ගරු සභාව බවට පත් කරමින් ඉදිරි කටයුතු ආරම්භ කරන ලදි.

**04. කල් දී ඇති යෝජනා**

***04:02 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා***

**04:02:01 බලංගොඩ බස් නැවතුම්පොළ ගොඩනැගිල්ලෙහි සිවිලිම සෘජු ශ්‍රමයෙන් ඉටුකිරීම සඳහා සභා අනුමැතිය ලබාගැනීම.**

බලංගොඩ බස් නැවතුම්පොළෙ සිවිලිම සෘජු ශ්‍රමයෙන් ඉටුකිරීම සඳහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:02 ඉන්දුනීසියාවේ සුරබයා නගරයේ පැවැත්වුනු එක්සත් නගර සහා ප්‍රාන්ත ආසියා පැසිෆික් කලාප රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් අදාළ ගරු සභිකයන් සඳහා අනියම් දීමනාව ගෙවීම. (ගමන් වියදම්)**

ඉන්දුනීසියාවේ සුරබයා නගරයේ පැවැත්වුනු එක්සත් නගර සහා ප්‍රාන්ත ආසියා පැසිෆික් කලාප රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් අදාළ ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමන් හා ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් සඳහා දිනකට මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ 01/2015/01 යටතේ එක් දිකනට ඇ.එ.ජ ඩොලර් හතළිහ බැගින් දින 6ක් සඳහා අනියම් දීමනාව ගෙවීම සඳහා වූ

යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර එම යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය

04:02:03 ඉන්දුනීසියාවේ සුරබයා නගරයේ පැවැත්වුනු එක්සත් නගර සහා ප්‍රාන්ත ආසියා පැසිෆික් කලාප රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් අදාළ ගරු සභිකයන් සඳහා ප්‍රමාද වූ ගුවන් ගාස්තු ගෙවීම.

ඉන්දුනීසියාවේ සුරබයා නගරයේ පැවැත්වුනු එක්සත් නගර සහා ප්‍රාන්ත ආසියා පැසිෆික් කලාප රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් අදාළ ගරු සභිකයන් සඳහා ප්‍රමාද වූ ගුවන් ගාස්තු වශයෙන් එක් අයෙකුට රු 51,000.00 බැගින් දෙදෙනෙකු සඳහා ගුවන් ගාස්තු ගෙවීමට සභා අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවළ මැතිතුමන් විසින් මෙහිදී අදහස් දක්වමින් මෙය ප්‍රමාද ගාස්තුවක් බැවින් මේ සඳහා අරමුදල් ගෙවීම පිළිබඳ කනගාටුවට පත්වන බව පවසා සිටින ලදී. එහිදී ගරු උප සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් තමා රාජ්‍ය සේවකයෙකු බැවින් විදේශ නිවාඩු අනුමත කර ගැනීමේදී සිදු වූ ප්‍රමාදය මෙම ප්‍රමාදයට බලපෑ බව පවසා සිටින ලදී. එවිට අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් මාස 2ට පෙර කාලයක සිට මෙම වැඩසටහන පිළිබඳ දැනුවත් කර තිබූ හෙයින් විදේශ නිවාඩු අනුමත කර ගැනීම සඳහා ප්‍රමාණවත් කාලයක් තිබූ බව ප්‍රකාශ කරන ලදී.

විදේශගත වීමට බොහෝ පිරිස් කැමති හෙයින් ඒ පිළිබඳව සිතා බලා මෙම ප්‍රමාද ගාස්තු සභා මුදලින් ගෙවීම සම්බන්ධයෙන් වූ යෝජනාව අකමැත්තෙන් වුවද ස්ථිර කරන බව ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවළ මැතිතුමන් විසින් පවසා සිටින ලදී.

විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:04 නගර සභාවේ පුරප්පාඩු රියදුරු තනතුර සඳහා තාවකාලික පදනම මත ඩී. එම්. අසේළ බණ්ඩාර මහතා බඳවා ගැනීම.**

නගර සභාවේ පුරප්පාඩු රියදුරු තනතුර සඳහා තාවකාලික පදනම මත සේවා ගිවිසුම් සකස් කර, ඩී. එම්. අසේළ බණ්ඩාර මහතා බඳවා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ05 මහජන පොළ ටෙන්ඩර් කිරීම**

මහජන පොළ ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන්, ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන්, ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන්,ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන්, ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමන් මෙම ටෙන්ඩර් කිරීමට අකමැත්ත දක්වමින් අදහස් ප්‍රකාශ කරන ලද අතර ඔවුන්ගේ සාමුහික අදහස වූයේ නැවත පොළ වෙළඳුන් සමඟ සාකච්ඡාවක් කැඳවිය යුතු බවයි.

එහෙයින් ගරු සභාපතිතුමන් විසින් ඉහත අදහස සලකා බලා නැවත වරක් මහජන පොළ වෙළෙදුන් සමඟ සාකච්ඡාවක් කැදවා ඔවුන්ගේ අදහස අනුව මහජන පොළ ටෙන්ඩර් කිරීම පිළිබඳ තීරණයක් ගැනීමට සුදුසු බවට ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ05 ආදායම් පරීක්ෂකවරු දෙදෙනා හට මාසිකව ලීටර් 10 බැගින් වූ ඉන්ධන ලබාදීම.**

ආදායම් පරීක්ෂකවරු දෙදෙනා හට ක්ෂේත්‍රයේ ගොස් ආදායම් රැස් කිරීමට ඇති හෙයින් ඒ සඳහා එක් අයෙකුට මාසිකව ලීටර් 10 බැගින් ආදායම් පරීක්ෂකවරු දෙදෙනා සඳහා ඉන්ධන ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ06 දෙහිගස්තළාව තලාව මාර්ගය සංවර්ධනය කිරීම**

දෙහිගස්තලාව තලාව මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සභා අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:07 පරගහ අරාවේ ගොඩහේන මාර්ගය සංවර්ධනය කිරීම**

පරගහ අරාවේ ගොඩහේන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සභා අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:08 මුගුණමලේ සුසාන භූමිය මාර්ගය සංවර්ධනය කිරීම**

මුගුණමලේ සුසාන භූමිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සභා අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් ඉහත යෝජනා සම්මත කර ගනිමින් සංවර්ධනය කිරීමට අපේක්ෂිත මාර්ගයන් සඳහා වියදම් කිරීමට අපේක්ෂිත මුදල් සීමාවන් පිළිබඳව විමසා සිටි අතර, ඒ සඳහා මුදල් ලැබෙන මාර්ගය පිළිබදවද සභාව දැනුවත් කරන ලෙස පවසා සිටින ලදී.

එහිදී පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් යොජනාව සම්මත වූ පසු ඇස්තමේන්තු සකස් කරන බැවින් ලබන සභා වාරයේදි ඒ දැරීමට සිදුවන වියදම පිළිබඳව සභාව දැනුවත් කල හැකි බව පවසා සිටින ලදී.

මෙහිදී විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:09 සුසානභූමි භාරකරු වශයෙන් ආර්.කේ.අමිත් ප්‍රේමසිරි මහතා බඳවා ගැනීම**

සුසානභූමි භාරකරු වශයෙන් ආර්.කේ.අමිත් ප්‍රේමසිරි මහතා රු.10,000.00 ක මාසික දීමනාව  මත බඳවා ගැනීම සඳහා සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන

ලදී. මෙහිදී විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:10 දෙටු සව්බල ප්‍රතිභා සැමැරුම් උළෙල සඳහා අනුග්‍රහය සැපයීම**

දෙටු සව්බල ප්‍රතිභා සැමැරුම් උළෙල සඳහා අනුග්‍රහය සැපයීම සඳහා සභා අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මේ පිළිබඳ ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් කරුණු විමසා සිටි අවස්ථාවේ පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් මෙම කරුණ නගර සභා විෂය පථයට අයත් නොවන රාජකාරියක් බැවින් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් විමසා ඉදිරි පියවර ගැනීමට අපේක්ෂා කරන බව පවසා සිටින ලදී.

විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**හදිසි යෝජනා**

**04:02:11 වැලිහරනාව මාර්ගය දෙපස කාණු යොදා නඩත්තු කිරීම මාර්ග නඩත්තු වැඩසටහන යටතේ සබරගමුව පළාත් සභාවෙන් අනුඥාත වී ඇති රු.1,968,143.51 වන කර්මාන්තය ගරු හිටපු පළාත් සභා අමාත්‍ය අතුළ කුමාර රාහුබද්ධ මැතිතුමන් විසින් නම් කරන ලද බළන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිළධාරි සුභ සාධන සංගමය යටතේ ඉටුකිරීම සුදුසු බවට ගෙනා යෝජනාව ගරු** උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:12 කිවුළවෙළ මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම මාර්ග නඩත්තු වැඩසටහන යටතේ සබරගමුව පළාත් සභාවෙන් අනුඥාත වී ඇති රු.1,884,646.36 වන කර්මාන්තය ගරු හිටපු පළාත් සභා අමාත්‍ය අතුළ කුමාර රාහුබද්ධ මැතිතුමන් විසින් නම් කරන ලද බළන්ගොඩ මෛත්‍රී අවමංගල්‍යාධාර සමිතිය යටතේ ඉටුකිරීම සුදුසු බවට ගෙනා යෝජනාව ගරු** උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ13 බලංගොඩ පරිවාස කාර්යාලයේ අත්‍යවශ්‍ය ඉදිකිරීම රු. 1,998,000.00 වන කර්මාන්තය සීමිත ටෙන්ඩර් කිරීම මගින් ඉටුකිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු** උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ14 වැවේවත්ත නගර සභා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ අළුත්වැඩියාව රු.250,000.00 වන කර්මාන්තයේදි එම ස්ථානයේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් නොමැති බැවින් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ලෙස ඉදිරියට නඩත්තු කිරීමටද නොහැකි බැවින් පළාත් පාලන කොමසාරිස් උපදෙස් ලබාගෙන කටයුතු කරන තෙක් නතර කර තැබීම සුදුසු ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු** උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 05. මන්ත්‍රී යෝජනා

### *05ඃ01 ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා*

05ඃ01ඃ01 දැනට පුරප්පාඩු වී ඇති බළන්ගොඩ නාගරික කොට්ඨාශ හදිසි මරණ පරීක්ෂක තනතුර හේතුවෙන් විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින් ඒ සඳහා ස්ථිර නිළධාරියෙකු පත්කරන මෙන් ගරු අධිකරණ ඇමතිතුමියගෙන් ඉල්ලා සිටින යෝජනාවක් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවයෙන් ඉදිරිපත් කිරීම.

05ඃ01ඃ02 රාස්සගල පාර පුළුල් කර කාපට් අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රමිතිය,අඩුපාඩු සහ අධීක්ෂණ කටයුතු ගරු සභාවේ අවධානයට යොමු කිරීම.

ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් අදහස් දක්වමින් බළන්ගොඩ නාගරික කොට්ඨාශ හදිසි මරණ පරීක්ෂක තනතුර දැනට මාස 3ක කාලයක සිට පුරප්පාඩුව පවතින බවත් අවශ්‍යතාවයක් වූ විටෙක

වැළිගපොළ හෝ ඕපනායක හදිසි මරණ පරීක්ෂකගේ සේවය ලබාගැනීමට සිදුවන බවත්, ඉන් මහජනතාවට මුහුන පෑමට සිදුවන අපහසුතාවය නැතිකිරීම සභාවේ සැමගේ සාමුහික වගකීමක් කොට ගෙන බලංගොඩ නගරය සඳහා ස්ථිර නිළධාරියෙකු පත්කරන මෙන් ගරු අධිකරණ ඇමතිතුමියගෙන් ඉල්ලා සිටින යෝජනාවක් සියළු මන්ත්‍රිවරුන්ගේ එකඟතාවයෙන් ඉදිරිපත් කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමන් ඇතුළු නාගරික මන්ත්‍රිවරුන් මේ සඳහා එකඟත්වය පළ කරමින් අදහස් දක්වන ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රි නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් රාස්සගල පාර පුළුල් කර කාපට් අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය විශාල මුදල් ප්‍රමාණයක් වැයකර සිදුකලද එහි ගිලාබසින තත්වයක් පෙන්නුම් කරන බවත්,එමනිසා එහි ඉදිකිරීම් ප්‍රමිතිය, අඩුපාඩු සහ අධීක්ෂණ කටයුතු පිළිබදව ගරු සභාවේ අවධානය යොමුකිරීම සුදුසු බවත් පවසා සිටින ලදී.

මෙවැනි කටයුතු සඳහා වැයවන්නේ රටේ ජාතික මුදල් බැවින් මේ පිළිබඳ සභාවේ අවධානය යොමුකල යුතු බව ගරු සභාපතිතුමන් විසින් පවසා සිටි අතර, ඉහතින් දැක්වූ යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:02 ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය***

05:02:01 දැනට රත්නපුර වෙත ගෙන ගොස් තිබෙන කම්කරු විනිශ්චය සභාව බලංගොඩ දිසා මහේස්ත්‍රාත් අධිකරණය වෙත ගෙන ඒම සඳහා කර තිබෙන යෝජනාවේ වර්තමාන ප්‍රගතිය සභාවට ඉදිරිපත් කිරීම.

05:02:02 බළන්ගොඩ උඩ ඇල්ලෙපොළ මූකලන්වත්ත මාර්ගය පවත්නා වර්ෂාව නිසා කැඩී යාමට ලක්ව ඇති හෙයින් එය පිළිසකර කිරීම සඳහා කඩිනම් පියවර ගැනීම.

05:02:03 කිරිදිගල මැද පාරේ කොහිලමුල්ල ගොඩහේන කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම.

05:02:04 ආනන්ද මෛත්‍රිය ජාතික පාසල පිටුපස පාර කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම

05:02:05 බලංගොඩ කුමාරගම ගැමුණු එක්සත් අවමංගල්‍යාධාර සමිතිය වෙත අඩුපාඩුවක්ව පවතින ශබ්ද වාහිනි යන්ත්‍රයක් ප්‍රදානය කිරීම.

05:02:06 බලංගොඩ උඩ ඇල්ලෙපොළ පල්ලෙකුඹුර මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම

ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය ,දැනට රත්නපුර වෙත ගෙන ගොස් තිබෙන කම්කරු විනිශ්චය සභාව බලංගොඩ දිසා මහේස්ත්‍රාත් අධිකරණය වෙත ගෙන ඒම සඳහා කර තිබෙන යෝජනාවේ වර්තමාන ප්‍රගතිය පිළිබඳව ගරු සභාවෙන් විමසා සිටි අවස්ථාවේ ගරු සභාපතිතුමන් විසින් ඒ පිළිබඳව ඉල්ලීමක් කර සකස් කරන ලද ලිපියක් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍යය තළතා අතුකෝරාළ මැතිණිය වෙත යවා ඇති බව පවසා සිටින ලදී.

එමෙන්ම තව දුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් විසින් බළන්ගොඩ උඩ ඇල්ලෙපොළ මූකලන්වත්ත මාර්ගය පවත්නා වර්ෂාව නිසා කැඩී යාමට ලක්ව ඇති හෙයින් එය පිළිසකර කිරීම සඳහා කඩිනම් පියවර නොගතහොත් පිළිසකර කිරීම් සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවන බව පවසා සිටි අතර තමන් විසින් ඉදිරිපත් කර ඇති අනෙකුත් යෝජනා පිළිබඳවද ගරු සභාවේ කඩිනම් අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී. ඉහතින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:03 ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා***

05:03:01 තුඹගොඩ ශ්‍රී සුදර්ශන මහා විහාරස්ථානයේ පුස්තකාලය සඳහා පැරණි ග්‍රන්ථ,පුස්කොළ පොත් තැබීම සඳහා පොත් රාක්කයක් ලබාදීම.

05:03:02 තුඹගොඩ අඩු අදායම්ලාභීන් හට ජලය ලබාදීම සඳහා ආධාරයක් ලබාදීම.

05:03:03 කොම්පෝස්ට් අංගනය නාය යාම හේතුවෙන් වගාකිරීමට නොහැකි වූ කුඹුර නැවත වගාකිරීමට හැකි පරිදි සකස් කර දීම.

05:03:04 ගරු සභාවට මහජනතාවගෙන් ලැබෙන ලිපි / පෙත්සම් සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීම, සභාගත කිරීම.

05:03:05 ඉරිදා පොළ භූමියට සෙනසුරදා දින රාත්‍රී කාලයේ විදුලිය ලබාදීම.

05:03:06 පදික වෙළෙදාම්කරුවන් ඉවත් කිරීමෙදි එම ඉවත්කරන ලද පදික වෙළඳුන්ගෙන් ලබාගත් නාම ලේඛනයේ සත්‍ය පිටපතක් ගරු සභාවේ දැනගැනීම පිනිස සභාවට ඉදිරිපත් කිරීමේ යෝජනාවක් ගෙන ඒම.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් බලංගොඩ නගරයට සම්පතක් බඳු තුඹගොඩ ශ්‍රී සුදර්ශන මහා විහාරස්ථානයේ පුස්තකාලය සඳහා පොත් රාක්කයක් ලබාදීම සඳහා සභාව මැදිහත්වන මෙන් ඉල්ලා සිටි අතර, පුස්කොල පොත් වැනි පෞරාණික වටිනාකමකින් යුත් ග්‍රන්ථ රාශියක් රැකගැනීම සඳහා එය අත්‍යවශ්‍ය බව පවසා සිටින ලදී.

එමෙන්ම එක් එක් වසම් සඳහා වෙන් කර ඇති ලක්ෂ 10 මුදලෙහි මන්ත්‍රී ප්‍රතිපාදන වශයෙන් ලබාදුන් මුදල අඩුකර ඉතිරි වූ ලක්ෂ 6 ප්‍රතිපාදන යොදවා තුඹගොඩ අඩු අදායම්ලාභීන් හට ජල සම්බන්ධතාවය නිවසට ලබා ගැනීම සඳහා ආධාර ලබාදෙන ඉල්ලා සිටි අතර කොම්පෝස්ට් අංගනය නාය යාම හේතුවෙන් වගාකිරීමට නොහැකි වූ විජේපාල මහතාගේ කුඹුර නැවත සකස් කරදීමට හෝ එහි වටිනාකමට සරිලන මුදලක් ඔහුට ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරන මෙන් මෙහිදී ඉල්ලා සිටින ලදී.

ගරු සභාවට මහජනතාවගෙන් ලැබෙන ලිපි / පෙත්සම් සභාවේ දැනගැනීම සඳහා සභාගත කිරීමේ අඩුපාඩුවක් දක්නට ලැබෙන බව පෙන්වා දුන් ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන්, එය නිසිපරිදි ක්‍රියාත්මක කරන මෙන් පවසා සිටි අතර ඉරිදා පොළ භූමියට සෙනසුරදා දින රාත්‍රී කාලයේ විදුලිය නොමැති හෙයින් වෙළෙන්දන් මහත් අපහසුතාවයන්ට ලක්වන බැවින්, ඒ සඳහා විදුලිය ලබාදෙන මෙන් ඉල්ලා සිටි අතර, පදික වෙළෙඳාම්කරුවන් ඉවත් කිරීමෙදි එම ඉවත්කරන ලද පදික වෙළඳුන්ගෙන් ලබාගත් නාම ලේඛනයේ සත්‍ය පිටපතක් ගරු සභාවේ දැනගැනීම පිනිස ලබාදෙන ලෙසත් එය පෙර සභාගත වී ඇති පරිදි විනිවිද භාවයෙන් යුතුව සිදුවී ඇති බවට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමන් විසින් පිළිතුරු ලබාදෙමින් පදික වෙළඳුන්ගෙන් ලබාගත් නාම ලේඛනයේ පිටපතක් ලබන සභා වාරයේදි ලබා දීමට අපේක්ෂා කරන බව පවසා සිටින ලදී.

විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා ප.ව.12.45 ට පමණ සභාවෙන් පිටව යන ලදී.

### *05:04 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා*

05:04:01 බෝම්බුව මාර්ගයේ ඉඹුල්පේ හිටපු ප්‍රාදේශිය ලේකම් ගුණසිංහ මහතාගේ නිවස අසළින් ආරම්භ වී වෛද්‍ය සුජිත් මහතාගේ නිවස දක්වා ඇති මාර්ගයේ අන්තර් සම්බන්ධිත කුට්ටි සිමෙන්ති ගල් හෝ කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම.

05:04:02 මිරිස්වත්ත ශ්‍රී ධර්මානන්ද විහාරස්ථානය අසළින් ආරම්භ වී දූනුමඩල ගහවත්ත ප්‍රදේශය දක්වා ඇති මාර්ගයේ බොෂි මහතාගේ නිවස අසළ සපත්තු බෝක්කුව සකස් කිරීම

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් බෝම්බුව මාර්ගයේ ඉඹුල්පේ හිටපු ප්‍රාදේශිය ලේකම් ගුණසිංහ මහතාගේ නිවස අසළින් ආරම්භ වී වෛද්‍ය සුජිත් මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය ඉතා අබලන් තත්වයේ ඇති බැවින් ඔවුන් විසින් කරන ලද ඉල්ලීමකට අනුව අන්තර් සම්බන්ධිත කුට්ටි සිමෙන්ති ගල් හෝ කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම සිදුකර දෙන ලෙසත්, මිරිස්වත්ත ශ්‍රී ධර්මානන්ද විහාරස්ථානය අසළින් ආරම්භ වී දූනුමඩල ගහවත්ත ප්‍රදේශය දක්වා ඇති මාර්ගයේ කොටසක් සභාව මගින් සංවර්ධනය කලද ඉතිරි කොටසට මුදල් ප්‍රමාණවත් නොවූ හෙයින්, එම මාර්ගයේ බොෂි මහතාගේ නිවස අසළ සපත්තු බෝක්කුව සකස් කිරීම සිදුකිරීම ඉතා අත්‍යවශ්‍ය කටයුත්තක් බැවින් එය සකස්කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් ඉදිරියේදි මෙම සපත්තු බෝක්කුව සකස් කිරීමට එකඟත්වය පල කරන ලද අතර ගරු සභාවේ විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

### *05:05 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා*

05:05:01 බෝම්බුව ආචාරිමලේ පළමු පිවිසුමෙහි කොන්ක්‍රීට් කිරීම හෝ තාර දැමීම.

05:05:02 පරගහකුඹුර පාර දූනට කැඩී ඇති ස්ථාන සෑදීම හා කාණු සුද්ධ පවිත්‍ර කිරීම

05:05:03 නගර සභා බල ප්‍රදේශයට අයත් අතුරු මාර්ග පිළිසකර කිරීමේදි සියළුම මාර්ග සඳහා සිමෙන්ති ගල් ඇල්ලීම.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් බෝම්බුව ආචාරිමලේ පළමු පිවිසුමෙහි මේවන තෙක් කිසිදු සංවර්ධන කාර්යයක් සිදු වී නොමැති හෙයින්, මාර්ගය සේදී ගොස් ඇති බවත් තව දුරටත් එම තත්වය වර්ධනය වීමට ප්‍රථම බෝම්බුව ආචාරිමලේ පළමු පිවිසුමෙහි කොන්ක්‍රීට් කිරීම හෝ තාර දැමීම පිළිබඳ ගරු සභාවේ අවධානය යොමුකරන ලෙසත් පවසා සිටින ලදී.

උඩකන්ද හරහා නගරය වෙත ගමන් කිරීමට ඇති පරගහකුඹුර පාර දැනට කැඩී ඇති ස්ථාන සෑදීම හා කාණු සුද්ධ පවිත්‍ර කිරීම පසුගිය දිනවල පැවති අයහපත් කාලගුණය නිසා නතර කිරීමට සිදු වූ බැවින් නැවත එහි සංවර්ධන කාර්යයන් ආරම්භ කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.

නගර සභා බල ප්‍රදේශයට අයත් අතුරු මාර්ග පිළිසකර කිරීමේදී සියළුම මාර්ග සඳහා තාර දැමීම හෝ කොන්ක්‍රීට් කිරීම වෙනුවට සිමෙන්ති ගල් ඇල්ලීම සිදු කිරීම සුදුසු බවත්, එහි කල් පැවැත්ම වැඩිබවත් පවසා සිටින ලදී. මෙහිදී ගරු සභාවේ විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:07 ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලීක්ෂා මැතිතුමා***

05:07:01 ප්‍රදේශවාසී ජනතාවගේ ඉල්ලීම පරිදි ගොරොක්ගහමඩ කිරිමණ්ඩලය අසල පාර නගර සභාවට පවරා ගැනීම.

05:07:02 අක්කර 18 ෆොන්සේකා මහතාගේ නිවස අසළ පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම.

05:07:03 තුඹගොඩ බැංකියවත්ත පාර සඳුන්ගම පාර අළුත්වැඩියා කිරීම

05:07:04 බලංගොඩ පොදු වෙළෙඳ සැළ කඩිනමින් අළුත්වැඩියා කිරීම

ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලීක්ෂා මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලික්ෂා මැතිතුමන් විසින් ගොරොක්ගහ මඩ කිරිමණ්ඩල අසල පාර නගර සභාවට පවරා නොමැති හෙයින් සංවර්ධනය කිරීමේ ගැටළුවක් පවතින බැවින් එම අඩි 100 පමණ වූ මාර්ග කොටස නගර සභාවට පැවරීමට කැමැත්ත පළ කරන ලද ලිපියක් සභාවට ඉදිරිපත් කරන අතර එම මහජනතාවගේ ඉල්ලීම පරිදි සිදුකර දෙන ලෙසත්, අක්කර 18 ෆොන්සේකා මහතාගේ නිවස අසළ පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම හා තුඹගොඩ බැංකියවත්ත පාර සඳුන්ගම පාර අළුත්වැඩියා කිරීම සඳහා ගරු සභාවේ අවධානය යොමු කරන ලෙසත් මෙහිදී ඉල්ලා සිටින ලදී.

එමෙන්ම දුර්වර්ණ වී ඉතා අබලන් තත්වයේ ඇති බලංගොඩ පොදු වෙළෙද සැළ පිළිබඳ නිරන්තරයෙන් පැමිණිලි ලැබෙන බවත් එය කඩිනමින් අළුත්වැඩියා කිරීම සිදු කිරීම පිළිබද ගරු සභාවේ අවධානය යොමු කරන ලෙසද මෙහිදී ඉල්ලා සිටින ලදී.

මේ සඳහා ගරු සභාපතිතුමන් විසින් පිළිතුරු ලබාදෙමින් මෙහි 05ඃ07ඃ01හා 05ඃ07ඃ02 යටතේ දක්වා ඇති යෝජනා සඳහා නගර සභා නිළධාරීන් සම්බන්ධ කර ගෙන පරීක්ෂා කර බලා තීරණයක් ගැනීමට අපේක්ෂා කරන බවත්, තුඹගොඩ බැංකියවත්ත පාර සඳුන්ගම පාර අළුත්වැඩියා කිරීම නඩත්තු කටයුතු යටතේ සිදුකිරීමට අපේක්ෂිත බවත් පවසා සිටි අතර, බලංගොඩ පොදු වෙළෙද සැළ සඳහා යෝජිත නව ගොඩනැගිල්ල ඉදිකරන තෙක්, පොදු වෙළෙද සැළ ගොඩනැගිල්ල තීන්ත අලේප කර ප්‍රතිනවීකරණය කර ජනතා පරිහරණයට සුදුසු අයුරින් සකස් කරන බවත් පවසා සිටින ලදී. එහිදී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් ද අදහස් දක්වමින් පොදු වෙළෙද සැලේ ගේට්ටුව ඉතා අබලන් තත්වයේ ඇති බැවින් එය පිළිසකර කරන මෙන් පවසා සිටින ලදී.

මෙහිදී ගරු සභාවේ විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05ඃ08 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා***

05ඃ08ඃ01 තුඹගොඩ මංසන්ධිය අසළට පොදු වැසිකිළි පද්ධතියක් සෑදීම.

05ඃ08ඃ02 ඕළුගංතොට රෝහළ අසළට පොදු වැසිකිළි පද්ධතියක් සෑදීම.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් තුඹගොඩ මංසන්ධිය යනු ඉතාමත් ජනාකීර්ණ ස්ථානයක් බැවින් එම ස්ථානයට මහත් අඩුපාඩුවක්ව පවතින පොදු වැසිකිළි පද්ධතියක් සෑදිම සඳහා ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටි අතර එවැනිම විශාල ජනතාවක් ගැවසෙන ඕළුගංතොට රෝහළ අසළට පොදු වැසිකිළි පද්ධතියක අවශ්‍යතාවයක් ඇති බැවින් ඒ සඳහාද සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා ගරු සභාවේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් මෙම රාස්සගල මාර්ගයට පිවිසුම් වන ස්ථානය සඳහා වැසිකිළියක මෙන්ම බස් නැවතුම්පළක අවශ්‍යතාවය ඇති බැවින්, බිම් කොටසක අවශ්‍යතාවය පිළිබඳව සාංඝික පන්සලේ ගරුතර ස්වාමීන් වහන්සේ දැනුවත් කර යම් බිම් කොටසක් ඉල්ලා ගැනීමටත්, ඉන් ලැබෙන ආදායම පන්සලට ලබා ගැනීමේ ක්‍රම වේදයක් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් පන්සල සමඟ මීට පෙරද මේ සඳහා ඉඩම් කොටසක් ලබාගැනීම සඳහා සාකච්ඡා කලද එය අසාර්ථක වූ බවත් එසේ ඉඩම් කොටසක් ලබාගැනීමේ හැකියාව ඇත්නම් සිංහ සමාජය මගින් ඉදිකිරීම සඳහා අනුග්‍රහය දැක්විය හැකි බවද පවසා සිටින ලදී.

ඕළුගංතොට රෝහළ අසළට පොදු වැසිකිළි පද්ධතියක් සෑදිම සඳහා වූ යෝජනාව යහපත් යෝජනාවක් බවත් ඊට සුදුසු ඉඩම් කොටසක් නැති වීම ගැටළුවක් බවත් ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් වැඩිදුරටත් අදහස් දක්වා සිටි අතර ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් අදහස් දක්වමින් තමාද මේ පිළිබද රෝහල් වෛද්‍ය අධිකාරි සමගද සාකච්ඡා කර ඇති බවත් වැසිකිලි නඩත්තු කිරීමේ ගැටළුව නිසා මෙම අදහස සාර්ථක කරගැනීමේ ගැටළු පැන නැගුන බවත් පවසා සිටින ලදී.

මෙහිදී ගරු සභාවේ විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:09 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා***

05:09:01 කරව්කැටිය මාර්ගය සංවර්ධනය කිරීම.

05෴09෴02 ක්‍රීඩාංගනය හා ඒ අවට මාර්ග සංවර්ධනය

05෴09෴03 දොරවෙළ පාලම ළඟින් කොන්ක්‍රීට් පාර ළමා උයන ළඟින් ක්‍රීඩාංගනය අයින දිගේ ගඟ දිගේ නව බස්රථ නැවතුම්පළ දක්වා දික්කිරීම.

05෴09෴04 ලංකා බැංකු මාවත තුරු උයන දක්වා පයින් ගමන් කල හැකි පාලමකින් යා කිරීම.

05෴09෴05 මහජන පොළ තුළ විදුලි බුබුළු කීපයක් සවිකිරීම

05෴09෴06 තානායමට පිවිසීමට ඇති එකම මාර්ගය බස්නැවතුම්පළ අසළ වලවල් වසා දමා සංවර්ධනය කිරීම.

05෴09෴07 නගර සභාවෙන් ලබා දෙන පදික වෙලෙඳ සැල් සඳහා තෝරා ඇති සුදුස්සන්ගේ නාම ලේඛනය,ස්ථිර ලිපිනය,දුරකථන අංක ලබාදෙන ලෙස යෝජනා කිරීම.

05෴09෴08 හිල් සයිඩ් රෙස්ට් මාර්ගය වළවල් වසා සංවර්ධනය කර මාර්ගයේ දෙපස සුද්ධ කිරීම

05෴09෴09 සේනක පෙදෙස වළවල් වසා සංවර්ධනය කර මාර්ගයේ දෙපස සුද්ධ කිරීම

05෴09෴10 සිටි ගාඩින්ස් පෙදෙස වළවල් වසා සංවර්ධනය කර මාර්ගයේ දෙපස සුද්ධ කිරීම

05෴09෴11 නගරයේ කාණු උඩ කොන්ක්‍රීට් කැලි ගැලවී හා කැඩී ඇති ස්ථාන පිළිසකර කර,දුර්ගන්ධය ඇති ස්ථාන සුද්ධ පවිත්‍ර කර,නගරයේ කාණුවලට හරවා ඇති වැසිකිළි පිළිබද සොයා බලා නිවැරදි කිරීම යනාදිය පිළිබඳ අවධානය යොමුකිරීම.

05෴09෴12 පෙර සභාවකදී යෝජනා වූ පරිදි, නව බස්නැවතුම් පළ අසළ බුළත් විට වෙළෙඳ සැල්වල අවශ්‍ය බෝඩ් සවිකිරීම, කෙළ ගැසීම සඳහා බඳුනක් තැබීම,එහි අයිතිය වෙළෙඳ සැලට පැවරීම යනාදි යෝජනා ක්‍රියාත්මක කිරීම.

05෴09෴13 මුදල් කමිටුවේ අනුමැතිය ලත්,කොඩිලස් කැමරා මිලදී ගෙන බස්නැවතුම්පලේ පඩිපෙල් සඳහා සවිකිරීම.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

*මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති* මැතිතුමා කරව්කැටිය මාර්ගය සංවර්ධනය කිරීම පිළිබඳව පසුගිය සභාවාර රැසකදී කථා කල බවත් මේවන විට ඒ සඳහා මුදල් අනුමත වී තිබීම පිළිබද සතුටු වන බවත් පවසා සිටි අතර, ක්‍රීඩාංගනය හා ඒ අවට මාර්ග සංවර්ධනය දොරවෙළ පාලම ළඟින් කොන්ක්‍රීට් පාර ළමා උයන ළඟින් ක්‍රීඩාංගනය අයින දිගෙ ගඟ දිගේ නව බස්රථ නැවතුම්පළ දක්වා දික්කිරීම පිළිබද නිතරම අවධාරණය කිරීමට හේතුව එම ස්ථානයේ, අළුතින් ඉදිකරන කඩපේළිය ඉදිකරන ලද ස්ථානයේ ගාල් කරන ලද ත්‍රීවීල් ගාල් කිරීම සඳහා හැකියාව ලැබෙන බවත්, ලංකා බැංකු මාවත තුරු උයන දක්වා පයින් ගමන් කල හැකි පාලමකින් යා කිරීමේ ඉදිකිරීම සඳහා සේනක බිල්ඩර්ස් වෙතින් පාලම් කණු දෙක ලබාගත හැකි බවත් පවසා සිටින ලදී.

එමෙන්ම තානායමට පිවිසීමට ඇති එකම මාර්ගයේ පිවිසුම අසල වලවල් වසා දමා සංවර්ධනය කිරීම සඳහා ගරු සභාවේ අවධානය යොමු කරන ලෙසත්, නගර සභාවෙන් ලබා දෙන පදික වෙළඳසැල් සඳහා තෝරා ඇති සුදුස්සන්ගේ නාම ලේඛනය,ස්ථිර ලිපිනය,දුරකථන අංක ලබාදීමට කටයුතු කරන ලෙසත් පවසා සිටි *ගරු නාගරික මන්ත්‍රී* ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් හිල් සයිඩ් රෙස්ට් මාර්ගය, සේනක පෙදෙස, සිටි ගාඩ්න්ස් පෙදෙස මාර්ගවල ඇති වලවල් කිහිපය කඩිනමින් සකස් කලහොත් එම මාර්ග ආරක්ෂා කර ගැනීමට හැකිවන බවත් පවසා සිටින ලදී.

එමෙන්ම නගරයේ කාණු උඩ කොන්ක්‍රීට් කැලි ගැලවී හා කැඩී ඇති ස්ථාන පිළිසකර කර, දුර්ගන්ධය ඇති ස්ථාන සුද්ධ පවිත්‍ර කර,නගරයේ කාණුවලට හරවා ඇති වැසිකිළි පිළිබද සොයා බලා නිවැරදි කිරීම යනාදිය පිළිබඳ අවධානය යොමුකරන මෙන් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රිතුමා,නව ලංකා හෝටලය ඉදිරිපස පදික මංතීරුවේ ගොඩගසා ඇති කොන්ක්‍රීට් ස්ලැබ් කොටස් ඉවත්කරන මෙන් පවසා සිටින ලදී.තවද පෙර සභාවකදී යෝජනා වූ පරිදි, නව බස්නැවතුම් පළ අසළ බුළත් විට වෙළෙඳ සැල්වල අවශ්‍ය බෝඩ් සවිකිරීම, කෙළ ගැසීම සඳහා බඳුනක් තැබීම,එහි අයිතිය වෙළෙඳ සැලට පැවරීම යනාදි යෝජනා ක්‍රියාත්මක වීමේ මන්දගාමී තත්වයක් ඇති බැවින් ඒ පිළිබදවද ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් පවසා සිටි අතර, මුදල් කමිටුවේ අනුමැතිය ලත්, කොඩ්ලස් කැමරා මිලදී ගෙන බස්නැවතුම්පළේ පඩිපෙල් සඳහා සවිකිරීමේ යෝජනාව කඩිනමින් ක්‍රියාත්මක කිරීම තුළින් බොහෝ දුරාචාර කටයුතු වළක්වා ගතහැකි බවත් පවසා සිටින ලදී. එමෙන්ම පරණ පොදු වෙළෙඳ සැලේ මුරකරු සිඟිති උයන මුරකිරීම සඳහාද යොමු කලහැකි නම් එය සිදුකරන මෙන් ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සිගිත්තන් වෙනුවට සවස් කාලයේ මත් ද්‍රව්‍යය භාවිතා කරන්නන් එම භූමියේ රැඳී සිටිනු දක්නට ලැබෙන බවත්, සිගිති උයන අසළ සභාව මගින් ඉවතළන අපද්‍රව්‍යය බැහැර කරන ස්ථානය සකස්කර තාවකාලික රථගාලක් සකස් කිරීම සුදුසු බවද පවසා සිටින ලදී.

ගරු සභාවේ විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:10 ගරු නාගරික මන්ත්‍රිනි පී චන්ද්‍රලතා මැතිතුමිය***

05:10:01 හුණුකුඹුර, කෝපිවත්ත මාර්ගයේ අඩුපාඩු පැවති කාණු පද්ධතිය හා ප්‍රධාන පාර ප්‍රතිසංස්කරණය කිරීම.

ගරු නාගරික මන්ත්‍රිනි පී චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි කේ. පී. පේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. හුණුකුඹුර, කෝපිවත්ත මාර්ගයේ අඩුපාඩු පැවති කාණු පද්ධතිය හා ප්‍රධාන පාර ජල නළ එළීමේදි පළුදු කර ඇති අතර නැවත තිබූ තත්වයට ප්‍රතිසංස්කරණය කර නොමැති බැවින් එම මාර්ගය යථා තත්වයට ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රිනි පී චන්ද්‍රලතා මැතිතුමිය මීට පෙර සභා වාරයේදි ඉල්ලා සිටි සෙවිලි තහඩු ලබා දීමේ යෝජනාව සඳහා අවශ්‍ය ලියකියවිලි ලබා දුන්නද නිළධාරින්ගේ අඩුපාඩු නිසා එය තවමත් සිදු නොවූ බව පවසා සිටින ලදී.

ගරු සභාවේ විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05፥11 ගරු නාගරික මන්ත්‍රි ඊ. ඒ. ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා***

05፥11፥01 කිරිදිගල මුගුණමලේ ගලපල්ලෙ අරාව පහළ කොටසට ජලය ලබාදීම.

05፥11፥02 කිරිදිගල වැලිහරනාව එකමුතු සුභ සාධන සංවිධානයට තහඩු ආවරණයක් සඳහා රාමු දෙකක් ලබාදීම.

05፥11፥03 තුඹගොඩ ශ්‍රි සුදර්ශන මහා විහාස්ථානයේ පුස්තකාලය සඳහා පොත් රාක්කයක් ලබාදීම සඳහා රු. 15,000.00 මුදලක් වෙන් කිරීම.

ගරු නාගරික මන්ත්‍රි ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රි ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා මන්ත්‍රි ප්‍රතිපාදන යොදවා කිරිදිගල මුගුනමලේ ගලපල්ලෙ අරාව ඉහළ කොටසට ජලය ලබාදීම සිදු කලාක් මෙන්ම ගලපල්ලෙ අරාව පහළ කොටසට ජලය ලබාදීම පිළිබඳව ද ගරු සභාවේ අවධානය යොමු කර ඒ සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන මෙන් ඉල්ලා සිටින ලදී.එමෙන්ම තම මන්ත්‍රි ප්‍රතිපාදන යොදවා කිරිදිගල වැලිහරනාව එකමුතු සුභ සාධන සංවිධානයට තහඩු ආවරණයක් සඳහා රාමු දෙකක් ලබාදීම හා තුඹගොඩ ශ්‍රි සුදර්ශන මහා විහාස්ථානයේ පුස්තකාලය සඳහා පොත් රාක්කයක් ලබාදීම සඳහා රු.15,000.00 මුදලක් වෙන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර දෙන මෙන් මෙහිදී ඉල්ලා සිටින ලදී.

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

*05ඃ12 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා*

05ඃ12ඃ01 රබර්වත්ත සියඹලාගහ වත්ත විලියම් මහතාගේ නිවස ඉදිරිපස පැති බැම්ම ඉදිකිරීම
05ඃ12ඃ02 පුරණගෙදර මාර්ගයේ ඇළ මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වා සිටි ගරු නාගරික මන්ත්‍රීතුමන් රබර්වත්ත සියඹලාගහ වත්ත විලියම් මහතාගේ නිවස ඉදිරිපස පැති බැම්ම ඉදිකිරීම ඉතා කඩිනම් හා අත්‍යවශ්‍ය කටයුත්තක් බැවින් දැනට ලෑලි දමා සකස් කර ඇති මෙම පැති බැම්ම තම මන්ත්‍රී ප්‍රතිපාදන යොදවා ඉටුකිරීමට අපේක්ෂා කරන බවත් ඊට අවශ්‍ය සහයෝගය ලබාදෙන ලෙසත් මෙහිදී ඉල්ලා සිටින ලදී. එමෙන්ම ඕළුගංතොට වෙල්යාය අස්වැද්දීම සඳහා වෙල්යායට ජලය සපයන පුරණගෙදර මාර්ගයේ ඇළ මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම ඉතා අත්‍යවශ්‍ය කටයුත්තක් බවත් එය කඩිනමින් සිදුනොවුහොත් ගොවි ජනතාවට මුහුණපෑමට සිදුවන දුෂ්කරතා පිළිබඳවත් ගරු සභාවට කරුණු දැක්වූ ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ඊට අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටුකර දෙන මෙන් පවසා සිටින ලදී. මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් මේ පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බව පවසා සිටින ලදී. විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

*05ඃ13* **ටෙන්ඩර් මණ්ඩල තීරණ ගරු සභාවේ අනුමැතියට යොමු කිරීම**

**ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් නැවත මහා සභාවට ඉදිරිපත් කරන ලදි. මෙම ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ අංක *05ඃ13:01,05ඃ13:02,05ඃ13:03,05ඃ13:04,05ඃ13:05,05ඃ13:06,05ඃ13:07,05ඃ13:08,05ඃ13:09,05ඃ13:10,05ඃ13:11 යන තීරණ සියල්ල සඳහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු* බවට ගරු සභාපතිතුමන් විසින් ගෙනෙන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිරකරන ලදී.මේ සම්බන්ධව විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

***05:13:01*●**පොදු වෙළඳ සැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය සඳහා ලංසු පත් 04ක් නිකුත් වු අතර එම ලංසුපත් හතරම ලැබී තිබුණි ඉන් ලංසුපත් 02 කොන්දේසි සම්පුර්ණ නොකිරිම මත ප්‍රතික්ෂේප විය. අනෙක් ලංසුපත් දෙක පිළිගත් අතර ඉන් වැඩීම මුදලක් ලෙස රු.7900.00 දක්වා තිබු අබ්දුල් මුන්තාලිෆ් මොහොමඩ් රෙමිෂින් මහතාගේ ලංසුව පිළිගැනිමට ටෙන්ඩර් මණ්ඩලය තිරණය කරන ලදී.

***05:13:02*●** පොදු වෙළඳ සැල අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරය සඳහා ලංසු පත් හතක් නිකුත් වී තිබු අතර එම ලංසු පත් හතම ලැබී තිබු අතර ඉන් ලංසුපත් හයක කොන්දේසි සපුරා නොතිබිම මත පුතික්ෂේප විය. ෆලීල් මෙහාහොමඩ් රවුෂාන් නමින් ලැබී තිබු ලංසුපත් සියලු කොන්දේසි සපුරා තිබු අතර එහි ලංසු මුදල ලෙස රු. 148,000.00 ක මුදලක් දක්වා තිබුණි එම ලංසුව පිළිගැනිමට ටෙන්ඩර් මණ්ඩලය තිරණය කරන ලදී.

***05:13:03*●** පොදු වෙළඳ සැල අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරය සඳහා ලංසු පත් තුනක් නිකුත් වී තිබු අතර එම ලංසුපත් තුනම ලැබී තිබුණි. එහි වැඩිම මුදල දක්වා තිබුණේ මහමදු නසිම් මුහමදු රිස්මි මහතා රු. 30,000.00 ලෙසය මෙම ලංසුව ඔහු විසින් පිළිගැනිමට නොහැකි බව දන්වන ලදි. ඒ අනුව දෙවන වැඩිම ලංසු මුදල දක්වා තිබු අබ්දුල් මුන්තාලි මොහොමඩ් රෙමිෂින් මහතාගේ රු. 20,150.00 ක ලංසු මුදල පිළිගැනිමට ටෙන්ඩර් මණ්ඩලය තිරණය කරන ලදි.

***05:13:04*●**පොදු වෙළඳ සැල අංක 11 දරණ මාළු කඩ කාමරය සඳහා ලංසු පත් 02ක් නිකුත් වී තිබු අතර එම ලංසුපත් දෙකම ලැබී තිබුණි. ඉන් වැඩිම ලංසු මුදල ලෙස රු. 7,560.00 ක මුදලක් දක්වා තිබු එම් සුරංග මැණික් විජේතුංග මහතාගේ ලංසුව පිළිගැනිමට ටෙන්ඩර් මණ්ඩලය තිරණය කරන ලදී.

***05:13:05*●** පොදු වෙළඳ සැල අංක 14 දරණ මාළු කඩ කාමර සඳහා එක් ලංසු පතක් නිකුත් වී තිබු අතර එම ලංසුපත ලැබී තිබුණි ප්‍රියන්ත ලාල් මුතුමාල මහතා එහි ලංසු මුදල ලෙස රු. 7,600.00 ක මුදලක් දක්වා තිබු අතර එම ලංසුව පිළිගැනිමට ටෙන්ඩර් කමිටුව තිරණය කරන ලදී.

***05:13:06*●** බලන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරය සඳහා ලංසු පත් දෙකක් නිකුත් වී තිබු අතර එම ලංසුපත් දෙකම ලැබී තිබුණි. ඒ ලංසුපත් අතරින් වැඩිම මුදලක් දක්වා ඇති ලංසුපත වුයේ ගලපත්තිගේ නිමල්

රෝහණ මහතා විසින් රු164,100.00 කි. එම මුදල අනෙකුත් ලංසුපත් වලට වඩා වැඩි බැවින් එම ලංසුව පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තිරණය කරන ලදී.

***05:13:07*●** බළන්ගොඩ නගරයේ බස් නැවතුම් පොළෙහි පෞද්ගලික බස් ගාල් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරය සදහා ලංසුපත් 3 ක් නිකුත් වී තිබූ අතර එම ලංසු පත් තුනම ලැබී තිබුනි.ඉන් වැඩිම මුදල දත්වා තිබූ එම්.උදයශාන්ත මහතාගේ රු.110,300.00 ක ලංසු මුදල පිළීගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

***05:13:08*●** එමෙන්ම පොදු වෙළඳසැල අංක 12 කඩ කාමරය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගය මහ සභාව මගින් තීරණය කිරීමට සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

***05:13:09*●** 2019 වර්ෂයේ බලංගොඩ නගර සභාවේ ප්ලාස්ටික් පොලිතින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථනය පවත්වා ගෙන යාම සඳහා ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීමේදී අවම ලංසු මුදල වන රු.16,500.00 ඉදිරිපත් කරන ලද දෙල්ගස්වත්ත,හුණුකුඹුර,බලන්ගොඩ ලිපිනයේ පදිංචි කෝන්ගහ වත්තගේ මංජුල නන්දන යන අය ටෙන්ඩර් මණ්ඩල කොන්දේසි සපුරා ඇති හෙයින් ඔහුට මෙම ටෙන්ඩරය ලබාදීමට සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන කරන ලදී.

***05:13:10*●** 2019 වර්ෂයේ බලංගොඩ නගර සභාවේ මහජන පොළ ආපන ශාලාව සඳහා ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීමේදී වැඩිම ලංසු මුදල වන රු.7515.00 ඉදිරිපත් කරන ලද අංක 320/ඒ,ඇල්ලෙපොළ බලංගොඩ ලිපිනයේ පදිංචි පී.එන්.කේ. ගජනායක යන අය ටෙන්ඩර් මණ්ඩල කොන්දේසි සපුරා ඇති හෙයින් ඔහුට මෙම ටෙන්ඩරය ලබාදීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන කරන ලදී.

***05:13:11*●** 2019 වර්ෂයේ බස් නැවතුම්පල පොදු වැසිකිලි හා මහජන පොළ පොදු වැසිකිළි සේවය පවත්වාගෙන යාම සඳහා ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීමේදී අවම ලංසු මුදල වන රු. 135,023.33 ට වඩා අඩුවෙන් එනම් රු. 84,000.00 ට ලංසුව ඉදිරිපත් කර තිබූ හෙයින් ප්‍රසම්පාදන මණ්ඩලය මගින් මෙම ටෙන්ඩර් අයදුම් පත ප්‍රතික්ෂේප කල බැවින් හා එම මුදලට ටෙන්ඩරය පවත්වා ගෙන යාමට අපහසු බව අයදුම්කරු පවසා සිටි බැවින් මෙම තත්වය පිළිබඳ සළකා බලා 2019 වර්ෂයේ බස් නැවතුම්පල පොදු වැසිකිලි හා මහජන පොළ පොදු වැසිකිළි සේවය පවත්වාගෙන යාම සඳහා අවම ලංසු මුදල රු.85,000.00 දක්වා අඩු කිරීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

***05ඃ14* හදිසි යෝජනා**

***05ඃ14ඃ01* පොදු වෙළඳසැල අංක 12 කඩ කාමරය ලංසු මුදල සම්බන්ධයෙන් තීරණයක් ගැනීම**

පොදු වෙළඳසැල අංක 12 කඩ කාමරය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගය මහ සභාව මගින් තීරණය කිරීමට සුදුසු බවත්, රු.7500.00 මුදලට එකදු ලංසු පතක්වත් නිකුත් වී නොතිබූ හෙයින් හා දැනට පොදු වෙළෙද සැලේ පවතින අඩුපාඩු පිළිබඳව සලකා බලා අංක 12 කඩ කාමරයේ ලංසු මුදල රු.5000.00 දක්වා අඩුකිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කර සිටින ලදී. එම යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05ඃ14 ඃ02* බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරය ටෙන්ඩර්කරු ප්‍රතික්ෂේප කිරීම නිසා නැවත ටෙන්ඩර් කිරීම පිළිබඳ තීරණයක් ගැනීම.**

බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරය සඳහා ලංසු පත් දෙකක් නිකුත් වී තිබූ අතර එම ලංසුපත් දෙකම ලැබී තිබුණි. ඒ ලංසුපත් අතරින් වැඩිම මුදලක් දක්වා ඇති ලංසුපත වූයේ ගලපත්තිගේ නිමල් රෝහණ මහතා විසින් රු164,100.00 කි.ඔහුට ටෙන්ඩරය ලබාදීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කර ටෙන්ඩර් මණ්ඩලය විසිර ගිය පසු ටෙන්ඩරය භාරගැනීමට නොහැකි බව පවසා ඔහු විසින් ලිපියක් ඉදිරිපත් කර තිබූ හෙයින් ඒ පිළිබඳ තීරණයක් ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් අදාළ ලිපිය සභාගත කරන ලදී.

ඒ පිළිබඳ ගරු සභාවේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව නැවත ටෙන්ඩර් කලද ඉහත ලංසු මුදල සාධාරණ නොවන බැවින් එම මුදලින් 10% ක මුදලක් අඩුකර නැවත ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් සිදු කල යෝජනාව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව මෙ සම්බන්ධව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2018.09.12 දින පැවති මුදල් හා කර්මාන්ත කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**07. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| **පුනරාවර්ථන ලැබීම්** | **8,218,046.97** |
| **වෙනත් ලැබීම්** | **3,218,782.42** |
| **මුලු ලැබීම්** | **11,436,829.39** |
| **පුනරාවර්ථන වියදම්** | **8,400,672.94** |
| **වෙනත් වියදම්** | **2,162,440.79** |
| **මුලු වියදම්** | **10,563,113.73** |

**ඉන්ධන වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.**

2018 -09-01 සිට 2018-09-30 දක්වා

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 150-0248 | 1,450.00 |
| 227-5020 | 45,835.00 |
| 37-7933 | 5,222.50 |
| 56-1906 | 2,360.00 |
| BC-0005 | 47,200.00 |
| DDR0008 | 590.00 |
| FCON0015 | 2,360.00 |
| GC 0001 | 4,165.00 |
| GK-1483 | 11,800.00 |
| GK-6227 | 42,511.00 |
| JD-4684 | 1,450.00 |
| LL-2110 | 18,092.00 |
| LL-7688 | 23,350.00 |

| | |
|---|---|
| MIXB001 | 1,450.00 |
| ND-5124 | 51,920.00 |
| OV/M 0017 | 0.00 |
| PF-4006 | 25,606.00 |
| QL-2901 | 5,437.50 |
| RB-4786 | 24,319.80 |
| RC-1107 | 9,710.00 |
| RC-1118 | 35,940.60 |
| RC-8183 | 18,585.00 |
| RD-8000 | 12,090.00 |
| RD-8240 | 21,445.40 |
| RE-2600 | 20,284.20 |
| SDRR 0013 | 8,761.50 |
| ZA 0228 | 5,893.00 |
| ZA-5039 | 69,679.00 |
| **එකතුව** | **516,057.50** |

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් අදහස් දක්වමින් ගරු සභාවට කමිටු වාර්තා හා ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීමේදි නිළධාරින්ගේ අත්සනට පහළින් නම හා තනතුර සඳහන් කිරීම යෝග්‍යය පව පවසා සිටි අතර ගරු සභාපතිතුමන් විසින් ඉදිරියේදි ඉදිරිපත් කරන වාර්තාවන්හි එසේ සඳහන් කිරීමට උපදෙස් ලබාදෙන බව පවසා සිටින ලදී.

**08. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**<u>ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමා</u>**

- ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් අදහස් දක්වමින් තමන් විසින් නියෝජනය කරනු ලබන ඇල්ලෙපොල කොට්ඨාශයේ මන්ත්‍රී ප්‍රතිපාදන යොදවා සිදු කිරීමේ අපේක්ෂාවෙන් සංවර්ධන යෝජනා අඩංගු ලිපියක් 2018.08.24 වන දින ගරු සභාව වෙත යොමු කලද, මියගිය නාගරික මන්ත්‍රී සුගත් ඉන්ද්‍රජිත් සොයුරාගේ යෝජනා ක්‍රියාත්මක කල හෙයින් තම යෝජනා ක්‍රියාත්මක කල නොහැකි බවට දැනගැනීමට ලැබුනු හෙයින් තමන් විසින් 2018.9.18 වන දින නැවත එම ක්‍රියාත්මක කරන ලද යෝජනා විමසා ලිපියක් ඉදිරිපත් කලද මේවන තෙක් එයට පිළිතුරු

නොලැබීම සම්බන්ධයෙන් කනගාටුව පළ කරන බවත් මෙනිසා එම කොට්ඨාශයේ ජනතාව ඉදිරියේ අසීරුතාවයට පත්වන බවත් පවසා සිටින ලදී.

● මෙවර පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 195 ක් ලබාගෙන ලංකාවේ පස්වන ස්ථානය ලබාගත් දිලීප සඳමාල් පුතුට සුභ පතුම් පළකරන ලද අතර ර/උඩගම කනිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පති ආර්.ප්‍රේමරත්න මහතාට හා අනුළා ගුරුතුමියට ස්තුති කිරිමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසා සිටින ලදී.

● සිගිති උයන අභාවයට යමින් පවතින බවත් මේ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම නගරයේ නාගරික නියෝජිතයන් වශයෙන් සියළු දෙනාගේ වගකීම වන බැවින් විශේෂ සැලැස්මක් හා ආරක්ශාවක් සහිතව මෙහි කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ගරු නාගරික මන්ත්‍රි අකිළ එල්ලාවල මැතිතුමන් විසින් පවසා සිටින ලදී.

● නගරයේ ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින මදුරු උවදුර නිසා සවස් කාලයේ නිවෙස්වල සිටිමට අපහසු තත්වයක් ඇති බැවින් සභාවේ මැදිහත් වීමෙන් මදුරු ගහණය අඩුකිරීම සඳහා ක්‍රියා මාර්ගයක් ගත යුතු බව මෙහිදී පවසා සිටිනලදී.

● අද දින සභාවට කළු පටි පැළඳගෙන පැමිණීමට හේතු වූයේ නගර සභාව සමඟ ඇති විරුද්ධතාවයකින් නොව ජාතික තළයේ පවතින මරණීය කුමන්ත්‍රන ඉන්ධන මිල සූත්‍රය සඳහා විරෝධය පෑම හා උතුරු පළාතේ සිංහල පුරවැසියෙකුට පදිංචි වීමේ ඇති අයිතිය උදුරා ගැනීම යන ජාතික ගැටළු සඳහා බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රි අකිළ එල්ලාවල මැතිතුමන් විසින් ප්‍රදේශයේ කණ්ඩායම් නායකයා ලෙස තමා විපක්ෂයේ කාර්යය භාර්යය සිදු කරන බව පවසා සිටින ලදී. එමෙන්ම කිසිවෙකුට නිරන්තරයෙන් සභා පරිශ්‍රයට පැමිණ අනවශ්‍ය චෝදනා, යෝජනා හෝ ඉල්ලීම් කිරීමට අයිතියක් නැති බවත් ගරු සභාවේ මන්ත්‍රීවරු නිරන්තරයෙන්ම කාර්යාලයට පැමිණීම කිසිසේත් අනුමත නොකරන බවත් පවසා සිටින ලදී.එමෙන්ම අද දින සභාවේ වූ සිද්ධිය අශෝබනකාරි බවත් ඉවසීමෙන් ඉදිරි කටයුතු කරගෙන යමින් ජනතාවට සේවය කිරීම සැමගේ අභිලාෂය විය යුතු බවත් පවසා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රි කේ.පී.පේමදාස මැතිතුමා</u>**

- ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමන් විසින් අදහස් දක්වමින් රටේ ක්‍රියාත්මක වන ඉන්ධන මිල සූත්‍රය සම්බන්ධයෙන් විරෝධය දැක්වීමට මෙය අවස්ථාවක් කරගන්නා බවත් තොරතුරු දැන ගැනීමේ පනත ඔස්සේද මේ පිළිබඳව විමසා සිටි අවස්ථාවේ පිළිතුරක් ලබා දීමට කිසිවෙකුට නොහැකි වූ බවත් පවසා සිටින ලදී.

## 09. අවසානය

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් අද දින සභාව අප්‍රසන්න ස්ථානයක් බවට පත්වුවද බදු ගෙවන ජනතාව වෙනුවෙන් මෙතෙක් වේලා රැදී සිටි සියළු දෙනාට ස්තුතිවන්ත වන බව පවසා සිටි අතර සභාවේ නිළධාරින් හට පසුගිය කාලය තුළ නිදහස් මානසිකත්වයෙන් ක්‍රියා කිරීමට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමන් විසින් ඉඩලබා නොදුන් බවත්, මරණීය තර්ජන එල්ල කරමින් ,නිළධාරීන් බිය වද්දමින්, නිළධාරින් විශාල මානසික පීඩනයකට ලක්කල බවත් අද දින සභා ගර්භය තුළ උන්මත්තකයෙකු ලෙස හැසිරෙමින් සභාපතිවරයාට පහර දෙමින් හැසිරුන විලාශය තරයේ හෙළා දකින බවත් මෙහිදී පවසා සිටින ලදී.

ඉදිරියේදි තමා විසින් සභාවේ සභාපතිවරයා ලෙස පුර්ණ බලතල යොදවා සභාවේ නිළධාරීන් රැක ගනිමින් නාගරික මන්තිවරුන්ගේ සංවර්ධන යෝජනා ඉටුකිරීමට සහය දෙමින් නගරයේ බදු ගෙවන ජනතාවට උපරිම සේවාවක් ලබාදීමට කටයුතු සිදු කරන බව ගරු සභාපතිතුමන් පවසා සිටින ලදී.

චමික ජයමිණි විමළසේන,
සභාපති,
බලංගොඩ නගර සභාව.